ආරක්ෂක අමාත්‍යාංශය
பாதுகாப்பு அமைச்சு
MINISTRY OF DEFENCE
අංක. 15/5, බාලදක්ෂ මාවත, කොළඹ 03, ශ්‍රී ලංකාව.
இல. 15/5, பாலதக்ச மாவத்தை, கொழும்பு 03, இலங்கை.
No. 15/5, Baladaksha Mawatha, Colombo 03, Sri Lanka. Website : www.defence.lk

මගේ අංකය / எனது இல / My No: එම්ඕඩී/එම්ඩී/08 ( *10* )
ඔබේ අංකය / உமது இல / Your No:

තැ. පෙ. / த. பெட்டி / P.O. Box: 572
දුරකථන / தொலைபேசி / Telephone: 2430860-9, 2430870-8
ලේකම් / செயலாளர் / Secretary: දුර./தொ./Tel. : 011 2381154, ෆැක්ස්/பெ./Fax.: 011 2541529, වි. තැපැල/மி.அ./Email : secdefence@defence.lk
දිනය / திகதி / Date: 2020 මැයි මස 19 වන

**<u>ශ්‍රී ලංකාවට අන්තවාදී තර්ජන එල්ලවන බවට පලවන ප්‍රචාර සාවද්‍යයි - ආරක්ෂක ලේකම්</u>**

අන්තවාදී තර්ජන පිලිබදව මහජනතාව නොමග යවමින් සමාජ මාධ්‍ය ජාලා තුල පැතිරෙන පලවීම් වලින් නොමඟ නොයන ලෙස ආරක්ෂක අමාත්‍යාංශය මහජනතාවගෙන් ඉල්ලා සිටී.

"සමාජ මාධ්‍ය ජාල තුළපැතිර යන ප්‍රවෘත්තියෙහි සත්‍යතාවයක් නොමැත. බුද්ධි අංශවලට ශ්‍රී ලංකාව තුල අන්තවාදී තර්ජන සම්බන්ධයෙන් තොරතුරු ලැබී නැත." ඔහු පැවසීය.

කොරෝනා වෛරස් වසංගතය පැතිරීම වැළැක්වීම සඳහා හමුදා සහ පොලිස් සහාය ලබා ගැනීම තුලින් රටේ ජාතික ආරක්ෂාව කිසිදු ආකාරයකින් නොසලකා හැර නොමැති බව ආරක්ෂක ලේකම් මේජර් ජෙනරාල් (විශ්‍රාමික)කමල් ගුණරත්න නැවත අවධාරණය කළේය.

ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමන්ගේ රජය විසින් මෙරට සියලුම බුද්ධි අංශ එක් ජාලයක් යටතට ගෙන ඇති අතර අභ්‍යන්තර හා බාහිර වශයෙන් ආරක්ෂාවට ඇති තර්ජන පිළිබඳව බුද්ධි තොරතුරු ලබා ගැනීම සඳහා බුද්ධි අංශ ශක්තිමත් කර ඇති බව ආරක්ෂක ලේකම් පැවසීය.

ජාතික ආරක්ෂාවද පවත්වා ගනිමින් කොරෝනා වෛරසය පැතිරීම පාලනය කිරීමට රජය ගන්නා උත්සාහයන්ට සහාය වීම සඳහා හමුදා සහ පොලිස් නිලධාරීන් යම් සංඛ්‍යාවක් යොදවා ඇති බවත් ඔහු පැවසීය.

"ශ්‍රී ලංකා නාවික හමුදාව කොරෝනා වෛරසය පාලනය කිරීම සඳහා සටන් වදිමින් සිටයදී නැවියන් සිය ගණනක් කොරෝනා වෛරසය ආසාදනය වීම නිසා පීඩාවට පත්ව සිටින අතරතුර දේශීය හා විදේශීයව ක්‍රියාත්මක වන මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් අත්අඩංගුවට ගැනීමේ කටයුතුවලද නියැලී සිටී. සංවිධානාත්මක අපරාධ සහ ත්‍රස්තවාදය පැතිරවීම හා ඕනෑම ආකාරයක ත්‍රස්තවාදයන් සම්බන්ධයෙන් ක්‍රියාකිරීම ආරක්ෂක හමුදාවන් සහ පොලිසිය විසින් සිදු කරයි." ඔහු පැවසීය.

ආරක්ෂක තොරතුරු ඒකකය
ආරක්ෂක අමාත්‍යාංශය

ස්ථාවර: **+94 112 430860** (දිගුව: 215)
ෆැක්ස් : **+94 112 478247**
ඊමේල් : modwebinfo@gmail.com
වෙබ් : **www.defence.lk**